# මල්කිගේ අපූරු දස්කම



M.M.සෙනල්යා තිසෙනි ගොඩමුන්න

# මල්කිගේ අපූරු දස්කම

එම්.එම් සෙනල්යා තිසෙනි ගොඩමුන්න

මහාමායා බාලිකා විද්‍යාලය
6 ශ්‍රේණිය A

2026.06.01

# පිදුම

නිරුදක කතරක මං මුළාවී
සිටින විට
සෙවනැල්ලක් වී
ජීවිතයේ අරුත කියා දී
නව ලොවට පියනගන්නට
මං පෙත් විවර කර දෙන
ආදරණීය මව්පිය දෙපළටත්, පාඨකයන්ටත්
ගරු විදුහල්පතිතුමියටත්
ආචාර්ය මණ්ඩලයේ ගුරු මෑණිවරුන්ටත්, ගුරු පියවරුන්ටත්
පිරිනමමි සෙනෙහසින්...........

සිසුවිය
සෙනල්යා ගොඩමුන්න.



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

CamScanner

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමී.

ප්‍රදීප් නිලංග දෑල,<br>
දියවඩන නිලමේ,<br>
ශ්‍රී දළදා මාලිගාව<br>
2026.05.10

එකෝමත් එක කාලෙක මලීකි කියලා පුංචි ගැහැණු ළමයෙක් හිටියා. මලිකි හමදාම පංතියේ පළමුවැනියා වුණා. මලිකි තරගවලිනුත් ප්‍රථමස්ථානය ලබා ගත්තා. මලිකි ඒ වගේම කීකරුයි.



මල්කි හිටියේ 3 ශ්‍රේණියේ. මල්කි දෙවැනි වාර විභාගයට සූදානම් වෙමින් හිටියේ. මල්කි පළමුවෙනි වාර විභාගයේ පන්තියේ පළමුවැනියා වගේම අංශයෙත් පළමුවැනියා වුණා.



මල්කි දෙවැනි වාර විභාගයට මුහුණ දීමට පාඩම් කරනවා වගේ ම නිවාඩු කාලය එළඹෙන තෙක් බලා ගෙන හිටියා.




ටිකෙන් ටික දවස් ගත වෙලා ගිහින් දෙවැනි වාර විභාගය ඇරඹුණා. මල්කි වාර විභාගයේ දී ප්‍රශ්න පත්‍රවලට හොඳින් පිළිතුරු සැපයුවා. වාර විභාගය අවසානයේ දී නිවාඩු කාලය ඇරඹුණා.



මල්කි නිවාඩු කාලයේ දී විවිධ සෙල්ලම් කළා. ඒ අතරේ මල්කි පොත් කියවූවා. වගේ ම පාඩම් කිරීමත් සිදු කළා.



දවසක් මල්කි මිදුලේ සෙල්ලම් කරමින් සිටින විට ගසක අත්තක ලේනෙක් දුකින් ඉන්නවා දැක්කා. මල්කි ලේනා ගාවට හෙමින් හෙමින් ගියා. ලේනා පොඩ්ඩක්වත් මල්කිට බය වුණේ නෑ. මල්කි දැක්කා ලේනාගෙ කකුලේ තුවාලයක් තිබ්බ බව



මල්කි ලේන් පැටියව හෙමෙන් අතට අරන් ගේ ඇතුළට අරන් ගිහින් ලේනාගේ කකුල වටේ වෙලුම් පටි ඔතලා ගහ උඩින් තිබ්බා.




මල්කි උදේට ඉස්කෝලේ යන්න කලින් ලේනට බත් දීලා ගියා. ටික දවසක් යද්දි ලේනට හොඳ වුණා.



දවසක් මල්කි ඉස්කෝලේ ඇරිලා ගෙදර එද්දී ලේනා ගහ උඩ හිටියේ නෑ. මල්කිට ගොඩක් බය හිතුණා. එක පාරටම ලේනා මල්කිගාවට ජම්බු පොකුරක් අරන් ඇවිත් මල්කිට දුන්නා.



මල්කිට හරිම සතුටුයි. මල්කිගෙ අම්මා මල්කිට ලේනට දැක්වූ කරුණාව ගැන සිතා තෑග්ගක් දුන්නා. මල්කිට ඉතේ මලක් පිපුණා වගේ.



නිමි.



නම -   එම්.එම්.සෙනල්යා තිසෙනි ගොඩමුන්න

පංතිය - 6 ශ්‍රේණිය A

පාසල -  මහාමායා බාලිකා විද්‍යාලය මහනුවර

පොතේ නම - මල්කිගේ අපූරු දස්කම

පංති භාර ගුරුතුමා/ගුරුතුමියගේ අත්සන

..............................

අංශ භාර ගුරුතුමා/ගුරුතුමියගේ අත්සන

..............................

U.G.P.R. [illegible]
Assistant Principal
Mahamaya Girls College
Kandy

# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වු වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මුලික අරමුණයි.
මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)

CS CamScanner